# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1690/10 - 2011 ජනවාරි 26 වැනි බදාදා - 2011.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දඹුල්ල ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (xiv) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව, දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2011 ජනවාරි මස 06 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා "දඹුල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කටයුතු පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" යනුවෙන් හැඳින්වේ.

2. දඹුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර භාවිතා කිරීම, පාලනය කිරීම හා එකී ආදාහනාගාරය භාවිතා කිරීම සඳහා වන ගාස්තු නියම කිරීම හා අයකිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් හෝ මෘත ශරීරයක කොටසක් හෝ මිනිස් කළලයක් ආදාහනය නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවල තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මතු ඉල්ලුම්කරු යයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් "1" උපලේඛනයට අනුකූලව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය :–

(i) මිය ගිය අය හා අයදුම්කරු අතර ඥාතීත්වය තහවුරු කළහැකි ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය ; (මේ සඳහා මිය ගිය අය පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් හෝ සභාවේ ගරු සභිකයෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ විවාහ සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක් ප්‍රමාණවත් වේ.)

(ii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් ලියවිල්ලක් ;

(iii) 1975 අංක 41 දරන විවාහ උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 110 වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තියේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයේ දඹුල්ල ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කරන බවට සඳහන් වී තිබිය යුතු ය.

(iv) මිය ගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය ;

(v) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය, සභාපති හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වන්නේ ය. ඒ අනුපිළිවෙළ මත ආදාහන වේලාවල් නියමකර අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාර ගාස්තු ලෙස රු.7000 ක ගාස්තුවක් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු ය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් මගින් වරින්වර සංශෝධනය කළ හැකි ය. එකී ගාස්තු ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය. එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට අයදුම්පත ලද වහාම දැන්විය යුතු ය.

8. සෑම දිනක ම පෙරවරු 06.00ත් පස්වරු 06.00 ත් අතර කාලය තුළ පමණක් ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරදිය යුතු ය. පස්වරු 06.00 ට පෙරාතුව වූ වේලාවක ආදාහනය සඳහා භාරගත් මෘත ශරීරයක් පස්වරු 06.00 පසු වූව ද ආදාහනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

9. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන්කර ඇති වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මියගිය අයගේ නම හා ඔහු මියයාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාවය, ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ඇතුළත් ලේඛනයක් ආදාහනාගාරය භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ආදාහනාගාරයේ දේහය ආදාහනය කරන අවස්ථාවේ යාන්ත්‍රික දෝෂයක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් සභාපතිවරයාගේ උපදෙස් මත එකී දේහය පිළිබඳව වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉල්ලුම්කරු විසින් එකඟ විය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනයකර දින 7 ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා භෂ්මාවශේෂ භාරගත යුතුවේ. නියමිත කාලය ඇතුළත භාරගනු නොලබන භෂ්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

13. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැති ව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වූවද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍ර ලාභියකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළවලට අලාභ හානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින් ගේ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ නොකළ යුතු ය. ඉදින් එවැනි අලාභයක් හෝ හානියක් හෝ සිදුවුවහොත් එකී ආදාහනයට අදාළ වූ අවසරපත්‍රධාරියා වගකිව යුතු වේ. එවැනි අලාභයක් තක්සේරු කිරීමෙන් අනතුරු ව එම අලාභය බලපත්‍රධාරියා වෙත දැක්වීමෙන් පසුව ඔහු විසින් එම වටිනාකම ගෙවිය යුතු ය. එම ගෙවීම පැහැර හරින්නේ නම් නිසි බලයලත් අධිකරණයක් හමුවට පමුණුවා එකී මුදල දඩයක් පරිදි අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

15. ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම ප්‍රාදේශීය සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

16. ආදාහනාගාරයක නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක්වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ -

"සභාව" යන්නෙන් දඹුල්ල ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් තත්කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල දඹුල්ල ප්‍රාදේශීය සභාවට පත්කර ගන්නා ලද සභාපති වරයා ද,

"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක් ද,

"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛනය 1*

*දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.
    ලිපිනය :———.
    ජාතික හැඳුනුම්පත් අංකය :———.
    ග්‍රාම නිලධාරි වසම :———.

02. මියගිය අයගේ නම :———.
    මියගිය අයගේ ලිපිනය :———.
    ජාතික හැඳුනුම්පත් අංකය :———.
    ග්‍රාම නිලධාරි වසම :———.
    ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :———.

03. අයදුම්කරු මියගිය අයට ඇති ඥාති සම්බන්ධය :———.

04. මරණ සහතිකයේ අංකය හා දිනය :———.

05. මරණ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :———.

06. මරණයට හේතුව :———.

07. මරණ පරීක්ෂණයක් තිබුණේ නම් එය පවත්වන ලද දිනය හා වේලාව :———.

08. මරණ පරීක්ෂකගේ නම හා තනතුර :———.

09. මරණ පරීක්ෂකගේ තීරණය :———.

10. මෘත ශරීරය ආදාහනය සඳහා අවසර ලැබුණේ ද/ නොලැබුණේ ද යන වග :———.

11. ආදාහනය කිරීමට අදහස් කරන දිනය හා වේලාව :———.

12. දුරකථන අංකය :———.

ඉහත මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය සියලු සහතික මේ සමග අමුණා ඇත.

...............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...................................

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :*

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

| | |
|---|---|
| ........................................................ | ........................................................ |
| ලේකම්, | සභාපති/බලය පැවරූ නිලධාරියා, |
| දඹුල්ල ප්‍රාදේශීය සභාව. | දඹුල්ල ප්‍රාදේශීය සභාව. |
| දිනය :———. | දිනය :———. |

2. අංක ........................................ හා ....................................... දිනැති ලදුපතින් රු. ................................................ ක් අය කරන ලදී.

3. ඉල්ලීම ඉටු කිරීමට අවසර දීම නිර්දේශ කරමි/නොකරමි.

4. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :

........................................................
විෂය ලිපිකරු.

දිනය :———

02-216/1

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

**අතුරු ව්‍යවස්ථා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (xiv) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව, හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2011 ජනවාරි මස 06 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*ආදාහනාගාර කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1. මෙම අතුරු ව්‍යවස්ථා හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කටයුතු පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්වේ.

2. හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර භාවිතා කිරීම, පාලනය කිරීම හා එකී ආදාහනාගාරය භාවිතා කිරීම සඳහාවන ගාස්තු නියම කිරීම හා අයකිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැති ව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් හෝ මෘත ශරීරයක කොටසක් හෝ මිනිස් කළලයක් ආදාහනය නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවල තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මතු ඉල්ලුම්කරු යයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් "1" උපලේඛනයට අනුකූල ව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය :–

(i) මිය ගිය අය හා අයදුම්කරු අතර ඥාතීත්වය තහවුරු කළහැකි ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය ; (මේ සඳහා මිය ගිය අය පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් හෝ සභාවේ ගරු සභිකයෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ විවාහ සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක් ප්‍රමාණවත් වේ.)

(ii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් ලියවිල්ලක් ;

(iii) 1975 අංක 41 දරන විවාහ, උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 110 වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තියේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කරන බවට සඳහන් වී තිබිය යුතු ය ;

(iv) මිය ගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය ;

(v) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය, සභාපති හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛනගත කළයුතු වන්නේ ය. ඒ අනුපිළිවෙල මත ආදාහන වේලාවල් නියමකර අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාර ගාස්තු ලෙස රු.6000 ක ගාස්තුවක් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු ය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් මගින් වරින් වර සංශෝධනය කළ හැකි ය. එකී ගාස්තු ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය. එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට අයදුම්පත ලද වහාම දැන්විය යුතු ය.

8. සෑම දිනක ම පෙරවරු 06.00ත් පස්වරු 06.00 ත් අතර කාලය තුළ පමණක් ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරදිය යුතු ය. පස්වරු 06.00 ට පෙරාතුව වූ වේලාවක ආදාහනය සඳහා භාරගත් මෘත ශරීරයක් පස්වරු 06.00 පසුවුව ද ආදාහනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

9. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන්කර ඇති වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මියගිය අයගේ නම හා ඔහු මියයාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාවය ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ඇතුළත් ලේඛනයක් ආදාහනාගාරය භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ආදාහනාගාරයේ දේහය ආදාහනය කරන අවස්ථාවේ යාන්ත්‍රික දෝෂයක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් සභාපතිවරයාගේ උපදෙස් මත එකී දේහය පිළිබඳ ව වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉල්ලුම්කරු විසින් එකඟ විය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනය කර පැය 72 ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා භෂ්මාවශේෂ භාරගත යුතුවේ. නියමිත කාලය ඇතුළත භාරගනු නොලබන භෂ්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

13. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැති ව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වුවද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍ර ලාභියකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපලවළට අලාභ හානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින්ගේ හෝ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ නොකළ යුතු ය. ඉදින් එවැනි අලාභයක් හෝ හානියක් හෝ සිදුවුවහොත් එකී ආදාහනයට අදාළ වූ අවසරපත්‍රධාරියා වගකිව යුතු වේ. එවැනි අලාභයක් තක්සේරු කිරීමෙන් අනතුරු ව එම අලාභය බලපත්‍රධාරියා වෙත දැක්වීමෙන් පසුව ඔහු විසින් එම වටිනාකම ගෙවිය යුතු ය. එම ගෙවීම පැහැර හරින්නේ නම් නිසි බලයලත් අධිකරණයක් හමුවට පමුණුවා එකී මුදල දඩයක් පරිදි අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

15. ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම ප්‍රාදේශීය සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

16. ආදාහනාගාරයක නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධානයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක්වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ ව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියමකර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ –
"සභාව" යන්නෙන් හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව ද,
"සභාපති" යන්නෙන් තත්කාලයෙහි බල පවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවට පත්කර ගන්නා ලද සභාපතිවරයා ද,
"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක් ද,
"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛනය 1*

***හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——— .
ලිපිනය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .
ග්‍රාම නිලධාරි වසම :——— .

02. මියගිය අයගේ නම :——— .
මියගිය අයගේ ලිපිනය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .
ග්‍රාම නිලධාරි වසම :——— .
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :——— .

03. අයදුම්කරු මියගිය අයට ඇති ඥාති සම්බන්ධය :——— .

04. මරණ සහතිකයේ අංකය හා දිනය :——— .

05. මරණ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :——— .

06. මරණයට හේතුව :——— .

07. මරණ පරීක්ෂණයක් තිබුණේ නම් එය පවත්වන ලද දිනය හා වේලාව :——— .

08. මරණ පරීක්ෂකගේ නම හා තනතුර :——— .

09. මරණ පරීක්ෂකගේ තීරණය :——— .

10. මෘත ශරීරය ආදාහනය සඳහා අවසර ලැබුණේ ද/ නොලැබුණේ ද යන වග :——— .

11. ආදාහනය කිරීමට අදහස් කරන දිනය හා වේලාව :——— .

12. දුරකථන අංකය :——— .

ඉහත මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවරදි බව සහතික කරමි. අවශ්‍ය සියළු සහතික මේ සමග අමුණා ඇත.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :——— .

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :*

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

.......................................................
ලේකම්,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

.....................................................
සභාපති/බලය පැවරූ නිලධාරියා,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

දිනය :——— .

දිනය :——— .

2. අංක ........................................ හා ...................................... දිනැති ලදුපතින් රු. .............................................. ක් අය කරන ලදී.

3. ඉල්ලීම ඉටු කිරීමට අවසර දීම නිර්දේශ කරමි/නොකරමි.

4. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :

......................................................
විෂය ලිපිකරු.

දිනය :——— .

02-216/2

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

උඩුනුවර ප්‍රාදේශීය සභාව

**අතුරු ව්‍යවස්ථා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (xiv) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2011 ජනවාරි මස 06 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*ආදාහනාගාර කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1. මෙම අතුරු ව්‍යවස්ථා උඩුනුවර ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කටයුතු පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්වේ.

2. උඩුනුවර ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර භාවිතා කිරීම, පාලනය කිරීම හා එකී ආදාහනාගාරය භාවිතා කිරීම සඳහා වන ගාස්තු නියම කිරීම හා අයකිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැති ව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් හෝ මෘත ශරීරයක කොටසක් හෝ මිනිස් කළලයක් ආදාහනය නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවල තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මතු ඉල්ලුම්කරු යයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් I වැනි උපලේඛනයට අනුකූල ව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය :-

(i) මිය ගිය අය හා අයදුම්කරු අතර ඥාතීත්වය තහවුරු කළහැකි ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය; (මේ සඳහා මියගිය අය පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් හෝ සභාවේ ගරු සභිකයෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ විවාහ සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක් ප්‍රමාණවත් වේ.)

(ii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් ලියවිල්ලක් ;

(iii) 1975 අංක 41 දරන විවාහ උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 110 වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තියේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයේ උඩුනුවර ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කරන බවට සඳහන් වී තිබිය යුතු ය;

(iv) මිය ගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය ;

(v) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සභාපති හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වන්නේ ය. ඒ අනුපිළිවෙළ මත ආදාහන වේලාවල් නියමකර අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා නියමිත ආදාහනාගාර ගාස්තුව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු ය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් මගින් වරින් වර සංශෝධනය කළ හැකි ය. එකී ගාස්තු ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය. එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම් ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට අයදුම්පත ලද වහාම ලිඛිතව දැන්විය යුතු ය.

8. සෑම දිනක ම පෙරවරු 06.00ත් පස්වරු 06.00 ත් අතර කාලය තුළ පමණක් ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරදිය යුතු ය. පස්වරු 06.00 ට පෙරාතුව වූ වේලාවක ආදාහනය සඳහා භාරගත් මෘත ශරීරයක් පස්වරු 06.00 පසු වූව ද ආදාහනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

9. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන්කර ඇති වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මියගිය අයගේ නම හා ඔහු මියයාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාවය, ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ඇතුළත් ලේඛනයක් ආදාහනාගාරය භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ආදාහනාගාරයේ දේහය ආදාහනය කරන අවස්ථාවේ යාන්ත්‍රික දෝෂයක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් සභාපතිවරයාගේ උපදෙස් මත එකී දේහය පිළිබඳ ව වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉල්ලුම්කරු විසින් එකඟ විය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනයකර පැය 72 ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා භෂ්මාවශේෂ භාරගත යුතුවේ. නියමිත කාලය ඇතුළත භාරගනු නොලබන භෂ්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

13. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැති ව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේවුවද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍ර ලාභියෙකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළවලට අලාභ හානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින්ගේ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ නොකළ යුතු ය. ඉදින් එවැනි අලාභයක් හෝ හානියක් හෝ සිදුවුවහොත් එකී ආදාහනයට අදාළ වූ අවසරපත්‍රධාරියා වග කිව යුතු වේ. එවැනි අලාභයක් තක්සේරු කිරීමෙන් අනතුරුව, එම අලාභය බලපත්‍රධාරියා වෙත දැන්වීමෙන් පසුව ඔහු විසින් එම වටිනාකම ගෙවිය යුතු ය. එම ගෙවීම පැහැර හරින්නේ නම් නිසි බලයලත් අධිකරණයක් හමුවට පමුණුවා එකී මුදල දඩයක් පරිදි අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

15. ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම ප්‍රාදේශීය සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

16. ආදාහනාගාරයක නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක්වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ ව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියමකර ඇති උපරිම දඩමුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ -
"සභාව" යන්නෙන් උඩුනුවර ප්‍රාදේශීය සභාව ද,
"සභාපති" යන්නෙන් තත්කාලයෙහි බල පවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල උඩුනුවර ප්‍රාදේශීය සභාවට පත්කර ගන්නා ලද සභාපති වරයා ද,
"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක් ද,
"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛනය 1*

***උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——— .
ලිපිනය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .
ග්‍රාම නිලධාරී වසම :——— .

02. මියගිය අයගේ නම :——— .
මියගිය අයගේ ලිපිනය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .
ග්‍රාම නිලධාරී වසම :——— .
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :——— .

03. අයදුම්කරු මියගිය අයට ඇති ඥාති සම්බන්ධය :——— .

04. මරණ සහතිකයේ අංකය හා දිනය :——— .

05. මරණ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :——— .

06. මරණයට හේතුව :——— .

07. මරණ පරීක්ෂණයක් තිබුණේ නම් එය පවත්වන ලද දිනය හා වේලාව :——— .

08. මරණ පරීක්ෂකගේ නම හා තනතුර :——— .

09. මරණ පරීක්ෂකගේ තීරණය :——— .

10. මෘත ශරීරය ආදාහනය සඳහා අවසර ලැබුණේ ද/ නොලැබුණේ ද යන වග :——— .

11. ආදාහනය කිරීමට අදහස් කරන දිනය හා වේලාව :——— .

12. දුරකථන අංකය :——— .

ඉහත මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවරදි බව සහතික කරමි. අවශ්‍ය සියලු සහතික මේ සමග අමුණා ඇත.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :——— .

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :*

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

......................................................
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

දිනය :——— .

....................................................
සභාපති/බලය පැවරූ නිලධාරියා,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

දිනය :——— .

2. අංක ....................................... හා ..................................... දිනැති ලදුපතින් රු. ............................................. ක් අයකරන ලදී.

3. ඉල්ලීම ඉටු කිරීමට අවසර දීම නිර්දේශ කරමි/නොකරමි.

4. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :——— .

......................................................
විෂය ලිපිකරු

දිනය :——— .

02-216/3

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

**අතුරු ව්‍යවස්ථා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (xiv) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2011 ජනවාරි මස 06 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*ආදාහනාගාර කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1. මෙම අතුරු ව්‍යවස්ථා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කටයුතු පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්වේ.

2. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර භාවිතා කිරීම, පාලනය කිරීම හා එකී ආදාහනාගාරය භාවිතා කිරීම සඳහාවන ගාස්තු නියම කිරීම හා අයකිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැති ව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් හෝ මෘත ශරීරයක කොටසක් හෝ මිනිස් කළලයක් ආදාහනය නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවල තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මතු ඉල්ලුම්කරු යයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් දෙවන උපලේඛනයට අනුකූල ව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) මියගිය අය හා අයදුම්කරු අතර ඥාතීත්වය තහවුරු කළහැකි ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය; (මේ සඳහා මියගිය අය පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් හෝ සභාවේ ගරු සභිකයෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ විවාහ සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක් ප්‍රමාණවත් වේ.)

(ii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් ලියවිල්ලක් ;

(iii) 1975 අංක 41 දරන විවාහ උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 110 වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තියේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයේ උඩුනුවර ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කරන බවට සඳහන් වී තිබිය යුතු ය.

(iv) මිය ගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය ;

(v) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සභාපති හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වන්නේ ය. ඒ අනුපිළිවෙළ මත ආදාහන වේලාවල් නියමකර අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාර ගාස්තු ලෙස මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතුය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් මගින් වරින් වර සංශෝධනය කළ හැකි ය. එකී ගාස්තු ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය. එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම් ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට අයදුම්පත ලද වහාම ලිඛිතව දැන්විය යුතු ය.

8. සෑම දිනක ම පෙරවරු 06.00ත් පස්වරු 06.00 ත් අතර කාලය තුළ පමණක් ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරදිය යුතු ය. පස්වරු 06.00 ට පෙරාතුව වූ වේලාවක ආදාහනය සඳහා භාරගත් මෘත ශරීරයක් පස්වරු 06.00 පසු වුව ද ආදාහනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

9. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන් කර ඇති වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මියගිය අයගේ නම හා ඔහු මියයාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාවය ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ඇතුළත් ලේඛනයක් ආදාහනාගාරය භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ආදාහනාගාරයේ දේහය ආදාහනය කරන අවස්ථාවේ යාන්ත්‍රික දෝෂයක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් සභාපතිවරයාගේ උපදෙස් මත එකී දේහය පිළිබඳ ව වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉල්ලුම්කරු විසින් එකඟ විය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනය කර දින 7 ක් ගතවීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා භෂ්මාවශේෂ භාරගත යුතුවේ. නියමිත කාලය ඇතුළත භාරගනු නොලබන භෂ්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

13. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැති ව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වුව ද, මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍ර ලාභියකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළවලට අලාභ හානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින්ගේ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ නොකළ යුතු ය. ඉදින් එවැනි අලාභයක් හෝ හානියක් හෝ සිදුවුවහොත් එකී ආදාහනයට අදාළ වූ අවසරපත්‍රධාරියා වග කිව යුතු වේ. එවැනි අලාභයක් තක්සේරු කිරීමෙන් අනතුරු ව එම අලාභය බලපත්‍රධාරියා වෙත දැක්වීමෙන් පසුව ඔහු විසින් එම වටිනාකම ගෙවිය යුතු ය. එම ගෙවීම පැහැර හරින්නේ නම් නිසි බලයලත් අධිකරණයක් හමුවට පමුණුවා එකී මුදල දඩයක් පරිදි අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

15. ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම ප්‍රාදේශීය සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

16. ආදාහනාගාරයක නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධානයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක, ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ –

"සභාව" යන්නෙන් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් තත්කාලයෙහි බල පවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල ප්‍රාදේශීය සභාවට පත්කර ගන්නා ලද සභාපති වරයා ද,

"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක් ද,

"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛනය 1*

| | | | රු. ශත |
|---|---|---|---|
| 1. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා | - | 5000.00 |
| 2. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොවන මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා | - | 5500.00 |

**උපලේඛනය 2**

***හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——— .
ලිපිනය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .
ග්‍රාම නිලධාරි වසම :——— .

02. මියගිය අයගේ නම :——— .
මියගිය අයගේ ලිපිනය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .
ග්‍රාම නිලධාරි වසම :——— .
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :——— .

03. අයදුම්කරු මියගිය අයට ඇති ඥාති සම්බන්ධය :——— .

04. මරණ සහතිකයේ අංකය හා දිනය :——— .

05. මරණ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :——— .

06. මරණයට හේතුව :——— .

07. මරණ පරීක්ෂණයක් තිබුණේ නම් එය පවත්වන ලද දිනය හා වේලාව :——— .

08. මරණ පරීක්ෂකගේ නම හා තනතුර :——— .

09. මරණ පරීක්ෂකගේ තීරණය :——— .

10. මෘත ශරීරය ආදාහනය සඳහා අවසර ලැබුණේ ද/
නොලැබුණේ ද යන වග :——— .

11. ආදාහනය කිරීමට අදහස් කරන දිනය හා වේලාව :——— .

12. දුරකථන අංකය :——— .

ඉහත මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය සියලු සහතික මේ සමග අමුණා ඇත.

...............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :——— .

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :*

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

......................................................
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,

දිනය :——— .

....................................................
සභාපති/බලය පැවරූ නිලධාරියා,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,

දිනය :——— .

2. අංක ....................................... හා ..................................... දිනැති ලදුපතින් රු. ............................................. ක් අය කරන ලදී.

3. ඉල්ලීම ඉටු කිරීමට අවසරදීම නිර්දේශ කරමි/නොකරමි. :——— .

4. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :——— .

......................................................
විෂය ලිපිකරු.

දිනය :——— .

02-216/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - PG 001221